**විශේෂ සටහන 9**

## පද්ධතිමය මූල්‍ය අර්බුද වළක්වාලීමේ සහ බැංකු අංශය තුළ මහජන විශ්වාසය යළි පිහිටුවීමෙහිලා මහ බැංකු සතු කාර්යභාරය

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බැංකු අංශය, රටේ මූල්‍ය අතරමැදිකරණය වෙනුවෙන් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරන අතර, මූල්‍ය අංශයේ සැලකියයුතු කොටසක් දරමින්, 2022 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් 61.9% ක ප්‍රතිශතයක් නියෝජනය කරයි. මෑත කාලීන බහුවිධ අභියෝග මධ්‍යයේ වුවද, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂකයන් මඟින් පෙන්නුම් කරන පරිදි, ශ්‍රී ලංකාවේ බැංකු අංශය ශක්තිමත්ව පවතියි. කෙසේවෙතත්, 2019 පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන සාර්ව ආර්ථිකය සම්බන්ධ ගැටලු ඇතුළු විවිධ හේතූන් නිසා බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඇති වූ පෙර නොවූ විරූ මට්ටමේ ආතතීන් හමුවේ, ශක්තිමත් අර්බුද කළමනාකරණ රාමුවක පැවැත්ම සහතික කිරීම වැදගත් වේ.

### 2. බැංකු පද්ධතියෙහි ස්ථාවරත්වයෙහි වැදගත්කම සහ ගෝලීය මූල්‍ය අර්බුදය තුළින් උගත් පාඩම්

ආර්ථික වර්ධනය සහ මහජනතාවගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණයකට බැංකු අංශයේ ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වේ. මෙය වඩාත් වැදගත් වන්නේ ආර්ථික කම්පන සහ ආතතිමය අවස්ථා තුළ දී ය. කෙසේ වෙතත්, ඉතිහාසය පුරා, බැංකු පද්ධතිය කෙරෙහි විශ්වාසය බිඳ වැටීම් සහ බැංකු පද්ධතිය කඩා වැටෙතියි යන අනිසි බියෙන් තැන්පතුකරුවන් තම මුදල් බැංකු පද්ධතියෙන් ආපසු ගැනීම් හේතුවෙන්, පද්ධතිමය මූල්‍ය අර්බුද කරා මඟපාදමින්, ලොව පුරා රටවල ආර්ථික කටයුතු කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑම් එල්ල වී ඇත. ඉහළ උත්තෝලනය (හිමිකම් ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ප්‍රාග්ධනය ඉහළ වීම), ණය ඉහළ යෑම, ණය ඇගයීම් ප්‍රමිති දුර්වල වීම, පාලනය සහ අවදානම් කළමනාකරණයෙහි අඩුලුහුඬුකම්, දේපළ සහ අනෙකුත් වත්කම්වල මිල අධික ලෙස ඉහළ යෑම්, ඉතා ඉහළ ලෙස රජය වෙත ණය ලබා දීම, අප්‍රමාණවත් අධීක්ෂණය සහ බාහිර ජංගම ගිණුමේ පවත්නා හිඟ තත්වයන් මෙම පද්ධතිමය අර්බුද ඇතිවීම සඳහා පොදු හේතූන් ලෙස හඳුනාගත හැකිය. පෙරදිග ආසියානු අර්බුදය (1997), ගෝලීය මූල්‍ය අර්බුදය (2007-2008) සහ යුරෝපීය අර්බුදය (2010) වැනි ජාත්‍යන්තර උදාහරණ මගින් අනාවරණය වන පරිදි, පද්ධතිමය අර්බුදයකින් හට ගන්නා මූල්‍ය ව්‍යසන සාමාන්‍යයෙන් වසර ගණනාවක් දක්වා පවතින අතර, එවැනි අර්බුදකාරී තත්වයන් නිසා සැලකියයුතු ලෙස ආර්ථික සංකෝචන වීම් සහ රාජ්‍ය මූල්‍ය පිරිවැය වැඩි වීම් කෙරෙහි විශාල වශයෙන් හේතුසාධක වෙමින් සමස්ත සමාජයට ම බලපෑම් එල්ල කරනු ලබයි.

#### ගෝලීය මූල්‍ය අර්බුදයෙන් උගත් පාඩම්

2007-2008 ගෝලීය මූල්‍ය අර්බුදය ඉන් පෙර පැවති මූල්‍ය අර්බුදවලට සමාන ලක්ෂණ වලින් සමන්විත වුවද, එම අර්බුදයෙහි ප්‍රතිඵල එයින් සෘජුවම බලපෑමට ලක් වූ රටවලට පමණක් සීමා නොවී, පෙර නොවූ විරූ ආකාරයෙන් ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිර ගියේය. ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොලෙහි වඩාත් පුළුල් මූල්‍ය සම්බන්ධතා ඇති දියුණු ආර්ථිකයන් සහිත රටවල් වල ගෝලීය අර්බුදය හට ගැනීම, එම අර්බුදයෙහි ප්‍රතිඵල විශාල වශයෙන් ලොව පුරා අනෙකුත් රටවල් වල ව්‍යාප්ත වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ගෝලීය මූල්‍ය අර්බුදය නිසා හටගත් නව අභියෝගයන් ලොව පුරා මහ බැංකු සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට දැනට පවතින නෛතික සහ ප්‍රතිපත්ති රාමුවල ඇති හිඩැස් සහ දුර්වලතා වටහා ගැනීමටත්, නව්‍ය අර්බුද කළමනාකරණ මෙවලම් හඳුන්වා දීමටත්, විශාල වශයෙන් දායක විය.

ඉහත දුර්වලතා සඳහා පිළියම් යෙදීමේ අරමුණින්, කඩා වැටෙන මූල්‍ය ආයතන විධිමත්ව කළමනාකරණය කිරීමට සහාය ලබා දීම සහ එමඟින් මූල්‍ය පද්ධතියට සහ මූර්ත ආර්ථිකයට ඇති වන සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ශක්තිමත් මූල්‍ය ආරක්ෂණ ජාලයක් සමඟ ඵලදායී අර්බුද කළමනාකරණ රාමුවක් අවශ්‍ය වන බවට, ගෝලීය නායකයන් විසින් පොදු එකඟත්වයකට පැමිණෙන ලදී. ඵලදායී අර්බුද කළමනාකරණ රාමුවක් සාමාන්‍යයෙන් පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020):

(i) අර්බුද වලට පෙර සූදානම් වීම සඳහා වන ආයතනික රාමුව

(ii) පූර්ව අධීක්ෂණ අතරමැදිකරණය

(iii) හදිසි ද්‍රවශීලතා සහාය

(iv) මූල්‍ය ආයතන නිරාකරණය

#### (i) අර්බුද වලට පෙර සූදානම් වීම සඳහා වන ආයතනික රාමුව

අර්බුද කළමනාකරණ රාමුවක් ඵලදායී වීමට නම්, මූල්‍ය ආරක්ෂණ ජාලයේ මූලික ආයතන අතර ඵලදායී ප්‍රතිපත්ති සම්බන්ධීකරණයක් සහිත ශක්තිමත් සහ ස්වාධීන ආයතනික රාමුවක් තිබීම අත්‍යවශ්‍ය වේ. මූල්‍ය ආරක්ෂණ ජාලයක මූලික ආයතන ලෙස මහ බැංකුව, මූල්‍ය අධීක්ෂණ සහ නියාමන නියෝජිත ආයතන, නිරාකරණ අධිකාරිය සහ මුදල් අමාත්‍යාංශය හඳුනා ගත හැක. මෙම ආයතනවලට ඕනෑම අවස්ථාවක දී අර්බුද කළමනාකරණ කාර්යයන් සඳහා සූදානම් වීමට, සම්බන්ධීකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි පැහැදිලි බලතල සහ ප්‍රමාණවත් ස්වාධීනත්වයක් තිබිය යුතුය.

#### (ii) පූර්ව අධීක්ෂණ අතරමැදිකරණය

පූර්ව අධීක්ෂණ ක්‍රියාමාර්ග මගින් බැංකු ආයතනවල මූල්‍ය තත්ත්වයෙහි පිරිහීම පිළිබඳ අනතුරු ඇඟවීමේ සලකුණු කල්තියා හඳුනා ගැනීමට හැකි වන අතර,

එමගින් එවැනි ආයතනවල මූල්‍ය ව්‍යසනයක් ඇතිවීමේ සම්භාවිතාව සහ එවැනි ව්‍යසන වල පිරිවැය අවම කරගැනීමට හැකියාව ලැබේ. ශක්තිමත් සහ විස්තීරණ අධීක්ෂණයක් සහතික කිරීම සඳහා අධීක්ෂකවරුන්ට ප්‍රමාණවත් සම්පත්, ශක්තිමත් නෛතික අධිකාරියක් සහ ආරක්ෂාවක්, නිසි බලතල සහ ශක්තිමත් පාලන ව්‍යුහයක් සහිත මෙහෙයුම් ස්වාධීනත්වයක් අවශ්‍ය වේ.

### (iii) මහ බැංකු විසින් ලබා දෙන හදිසි ද්‍රවශීලතා සහාය

මහ බැංකු විසින් මූල්‍ය ආයතන වෙත හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම අර්බුද කළමනාකරණ රාමුවක අත්‍යවශ්‍ය අංගයක් වනුයේ, එමගින් මූල්‍ය ආයතනයක හෝ ආයතන කිහිපයක හටගන්නා තාවකාලික ද්‍රවශීලතා අවදානම් අවම කිරීමට මෙන්ම එම මූල්‍ය ආයතන බුන්වත්භාවය කරා ළඟාවීම හෝ පද්ධතිමය මූල්‍ය අස්ථාවරත්වයක් ඇතිවීමේ අවදානම මඟහරවා ගැනීමට සහාය ලබා දෙන බැවිනි. ඒ අනුව, මහ බැංකු විසින් හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම සඳහා වන රාමුව මූල්‍ය අර්බුද සඳහා සූදානම් වීමේ මෙවලමක් ලෙස මැනවින් ස්ථාපනය කළ යුතුය. තවද, මෙම ද්‍රවශීලතා සහාය ලබා දිය යුත්තේ මහ බැංකු ශේෂ පත්‍ර වල ආරක්ෂකභාවය සහතික කර ගනිමින් මෙන්ම බැංකු ක්ෂේත්‍රයෙහි පැවතිය යුතු විනය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් ද අවම වන ලෙසයි.

ගෝලීය මූල්‍ය අර්බුදයට පෙර, අවශ්‍ය ඇප සුරකුම් නැති බැංකු බුන්වත්යැයි යන උපකල්පනය මත, මහ බැංකු විසින් ණය ලබා දිය යුත්තේ මනා ඇප සුරකුම් සහිත බැංකු වෙත පමණක් බව හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමෙහි මූලික සංකල්පය විය. හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමේ රාමුවෙහි සැලකිය යුතු වැඩි දියුණු කිරීම් සිදු කිරීමට මහ බැංකුවලට උපකාරී වූ, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් උගත් ප්‍රධාන පාඩම් පහත පරිදි සාරාංශ ගත කළ හැකිය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020):

(අ) සුදුසුකම - පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු පමණක් නොව, සියලු බැංකු හදිසි ද්‍රවශීලතා සහාය සඳහා සුදුසුකම් ලැබිය යුතුය. ඇතැම් අවස්ථාවල දී, මූල්‍ය ස්ථාවරත්වය රැක ගැනීම සඳහා පද්ධතිමය වශයෙන් වැදගත් වන බැංකු නොවන මූල්‍ය සමාගම් වෙත ද මහ බැංකු විසින් හදිසි ද්‍රවශීලතා සහාය සපයනු ලැබීමට හැකි විය යුතුය.

(ආ) නුබුන්වත්භාවය - අධීක්ෂකවරුන් විසින් නුබුන්වත් සහ ශක්‍ය යැයි සලකනු ලබන බැංකු වෙත පමණක්, මහ බැංකුවල අභිමතය පරිදි හදිසි ද්‍රවශීලතා සහාය යටතේ ණය ලබා දීම සිදු කළ යුතුය. නුබුන්වත් සහ ශක්‍යභාවය ඇගයීමේදී විෂය ප්‍රවීනයන්ගේ පෙර සහ පසු දැක්මක් සහිත විනිශ්චයක් යොදාගත යුතුයි. බුන්වත් ආයතන වෙත එවැනි සහායක් දීමට අවශ්‍ය වුවහොත්, රජයෙන් හානිපූර්ණයක් ඉල්ලා සිටිය යුතුය.

(ඇ) ඇප සුරකුම් - හදිසි ද්‍රවශීලතා සහාය යටතේ ලබා දෙන ණය පහසුකම් සඳහා සෑම විටම ප්‍රමාණවත් පරිදි ඇප සුරකුම් තැබිය යුතු අතර, විශාල පරාසයකට අයත් වන්නා වූ, වගකීම් වලින් නිදහස් වත්කම් ඇපකර ලෙස පිළිගැනීමට මහ බැංකුවලට හැකි විය යුතුය. ප්‍රතිපාර්ශ්වයක් ණය පැහැර හරින අවස්ථාවකදී, පියවීමට, කළමනාකරණය කිරීමට සහ උපලබ්ධි කිරීමට නිවැරදි ක්‍රියාවලි සමඟ මීත් පෙර නිගමනය කළ කපා හැරීම් ද ඇතුලත්ව, එවැනි වත්කම් අගය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් ස්ථාපන කළ යුතුය.

**හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමෙහි ප්‍රධාන අභියෝග-** අපකීර්තිය, එනම්, මහජන විශ්වාසය පළුදු වේ යැයි යන මතය හේතුවෙන් මහ බැංකු ද්‍රවශීලතා සහාය වෙත යොමු වීමට බැංකු ආයතන දක්වන අකමැත්ත, විදේශ ව්‍යවහාර මුදලින් ණය සැපයීම සහ නිරාකරණය යටතේ පවතින බැංකුවකට හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම, මහ බැංකු විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝග වේ.

### (iv) මූල්‍ය ආයතන නිරාකරණය

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බාධා කිරීමකින් තොරව, දුර්වල හෝ ආර්ථික වශයෙන් බිඳ වැටෙන බැංකුවල ගැටලු සඳහා පිළියම් යෙදීමේ තීරණාත්මකභාවය හේතුවෙන්, ශක්තිමත් අර්බුද කළමනාකරණ රාමුවක් සඳහා විධිමත් නිරාකරණ ක්‍රියාවලියක් අතිශයින් වැදගත් වේ. බැංකු ආයතනයක් බුන්වත් ලෙසට හෝ බුන්වත් වීමට ඉඩ ඇති ලෙසට හෝ එම ආයතනය නියාමන අවශ්‍යතා දැඩි ලෙස උල්ලංඝණය කරන බවට හෝ හඳුනා ගැනීමෙන් පසු, එහි අහිතකර ප්‍රතිවිපාක මුළු මහත් ආර්ථිකය වෙත ගලා යෑම වළක්වමින්, මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා ශක්තිමත්, තීරණාත්මක සහ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. නිරාකරණය පිළිබඳ ජාත්‍යන්තර පරිචයන් තුළ ඇති මූලධර්ම මගින් තැන්පතුකරුවන්ගේ සහ ණය හිමියන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින්, මූල්‍ය පද්ධති ස්ථායීතාවය රැක ගැනීම සඳහා කඩිනමින් ක්‍රියා කිරීමටනම් අවශ්‍ය බලතල සහ මෙවලම් බලධාරීන් සතුව ඇති බව සහතික කළ යුතු වේ.

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් වසර 15කට පසුව පවා, අධික උද්ධමනය, වැඩි වන පොලී අනුපාත සහ මූල්‍ය වෙළඳපළ අස්ථාවරත්වය තුලින් පෙන්නුම් කරන පරිදි, විශේෂයෙන් කොවිඩ්-19 වසංගතයෙන් පසුව ගෝලීය

8

මූල්‍ය ස්ථායිතාවයේ අවධානම වැඩිවීමක් පෙන්නුම් කරයි. මෑතකදී කඩා වැටුණු කැලිෆෝනියාවෙහි සිලිකන් වැලි බැංකුව සහ නිව්යෝර්ක්හි සිග්නේචර් බැංකුව ලෝකය පුරා ගෝලීය මූල්‍ය වෙළඳපලට දැඩි බලපෑමක් එල්ල කළ අතර, යුරෝපීය වෙළඳපල තුල පෙන්නුම් කරන ලද අස්ථාවරත්වයන්, එලදායී අර්බුද කළමනාකරණ රාමුවක අවශ්‍යතාවය නැවතත් මනාව අවධාරණය කරන ලදී.

## 3. ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය තුළ පද්ධතිමය මූල්‍ය අර්බුද වළක්වාලීම සහ මහජන විශ්වාසය යළි නගා සිටුවීම

ඉතිහාසයේ විශාලතම සෞඛ්‍ය හා ආර්ථික ව්‍යසනය වන කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ 2020 වසරේ සිට පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාව නොයෙකුත් ආකාරයේ බහුවිධ අභියෝග රැසකට මුහුණ දුන්නේය. විදේශ සංචිත පහත වැටීම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම, රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා, ඉහළ උද්ධමනය, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සහ අමුද්‍රව්‍ය හිඟ වීම ඇතුළු අසාමාන්‍ය සාර්ව ආර්ථික තත්ත්වයන් ඇති වීමට වසංගතයෙන් පසු කාලීනව හට ගත් අවහිරතා මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු මන්දගාමීව යථා තත්ත්වයට පත් වීම සහ දේශපාලන අවිනිශ්චිතතාවයන් ද හේතු විය. මෙම අසාමාන්‍ය වූ සාර්ව ආර්ථික තත්වයන් හමුවේ ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය හට පෙර නොවූ විරූ මට්ටමේ ආතතියක් සමඟින් අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය.

### 3.1. වත්මන් අභියෝග හමුවේ මූල්‍ය පද්ධති ස්ථාවරත්වය රැක ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

සාමාන්‍ය අවස්ථාවල දී, බලපත්‍රලාභී වාණිජ බැංකු වලට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සපයනු ලබන විවිධ ද්‍රවශීලතා සහායන් ලබා ගැනීමේ විකල්ප මාර්ගයන් පහත දක්වා ඇත.

අ) නිත්‍ය ණය පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු වලට සපයනු ලබන ඇපකර සහිත එක්දින ණය පහසුකම්

ආ) දිනය තුල ලබා දෙන ණය පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු වලට දිනය තුළ සපයනු ලබන ඇපකර සහිත ණය පහසුකම්

ඇ) කාලීන ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා විවට වෙළඳපොල කටයුතු ක්‍රමය යටතේ පවත්වනු ලබන වෙන්දේසි හරහා ලබා දෙන ණය පහසුකම්

කෙසේ වෙතත්, දැඩි අහිතකර ආර්ථික සහ වෙළඳපොල ප්‍රවණතාවලින් හට ගන්නා සුවිශේෂී තත්ත්වයන් තුළ දී මෙම විකල්ප ක්‍රම මගින් බැංකු අංශය සඳහා ලබාදෙන ණය තුලින් ප්‍රමාණවත් ද්‍රවශීලත්වයක් සහතික නොකෙරෙනු ඇත.

### 3.2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන අර්බුද කළමනාකරණ මෙවලම්

කොවිඩ්-19 වසංගතය පැතිර යෑමත් සමග මෑතක දී ශ්‍රී ලංකාවේ දිගින් දිගට ම හටගත් සුවිශේෂී සාර්ව ආර්ථික ප්‍රවණතා හමුවේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය රැක ගැනීමේ අරමුණ ඇතිව බැංකු අංශයේ ද්‍රවශීලතාව ඉහළ නංවන අතරතුර, මූල්‍ය පද්ධතිය පිළිබඳව මහජනතාවගේ විශ්වාසය සුරැකීමත් බැංකු අංශයේ අර්බුද කළමනාකරණ සූදානම් වීම් ශක්තිමත් කිරීමත් සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කරන ලදී. මෙම ලිපිය මගින් බැංකු අංශය වෙත ලබා දෙන හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුව (ELA), බැංකු නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම, අර්බුද කළමනාකරණ රාමුව ස්ථාපනය කිරීම සහ වඩාත් තීව්‍ර වූ අධීක්ෂණ ප්‍රවේශයන් යනාදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද පූර්ව ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රධාන වශයෙන් විස්තර කෙරේ.

#### 3.2.1. අවසන් ණය දෙන්නා - හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුව

1949 අංක 58 දරන වත්මන් මුදල් නීති පනතට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගෙන යෑමේ මූලික අරමුණ යටතේ, මූල්‍ය පද්ධතිය තුළ මහජන විශ්වාසය තහවුරු කිරීමේ අවසන් වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මේ සම්බන්ධයෙන්, මූල්‍ය ආයතනවල සුරක්ෂිත බව සහ ශක්තිමත් බව ප්‍රවර්ධනය කිරීම මගින් මූල්‍ය පද්ධතිය තුළ හට ගත හැකි ඕනෑම අහිතකර බලපෑමක් අවම කිරීම සඳහා අවසන් ණය ලබා දෙන්නා ලෙස කටයුතු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ යුතු ප්‍රධාන කාර්යභාර අතරින් එකකි.

ශ්‍රී ලංකාවේ බැංකු අංශය සඳහා අවසන් ණය දෙන්නා ලෙස, පද්ධතිමය මූල්‍ය ව්‍යාකූලතාවයක් ඇති කළ හැකි ඕනෑම අහිතකර ප්‍රවණතාවක් මැඩපැවැත්වීම සඳහා මුදල් නීති පනත යටතේ පවතින විධිවිධාන/ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය පවතින අතර, ඒ සඳහා වගකිව යුතු වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේ දී මූල්‍ය සහ බැංකු ස්ථාවරත්වය සම්බන්ධයෙන් හට ගන්නා ඕනෑම තර්ජනයක් වැළක්වීමේ අරමුණ ඇතිව මුදල් නීති පනතේ 86 වන වගන්තිය යටතේ, හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුව පිහිටුවන ලදී. ආර්ථිකය වෙත අඛණ්ඩ ණය සැපයුමක් තහවුරු කිරීමට සහ සුවිශේෂී අවස්ථාවල දී හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බැංකු ආයතනවල ද්‍රවශීලතා මට්ටම ශක්තිමත් කිරීම සහ එමගින් මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය පවත්වා ගෙන යෑම, මෙම හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුවෙන් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵල විය.

2022 වසරේ දී, පුළුල් පරාසයකට අයත් ඇප සුරැකුම් ගණනාවක් සහ එම සුරැකුම් සඳහා තක්සේරු කිරීමේ ක්‍රමවේදයක්, ද්‍රවශීලතාව සහ නුබුන්වත්භාවය පිළිබඳ

8

ඇගයීමේ නිර්ණායක, අධීක්ෂණ ක්‍රියාමාර්ග සහ මෙම හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුව ක්‍රියාත්මක කිරීමෙහි නිරත වී සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු අතර දියුණු සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇතුළත් කිරීම මගින් මෙම රාමුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

**3.2.2. හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුවේ ප්‍රධාන ලක්ෂණ**

අ) **සුදුසුකම්ලත් මූල්‍ය ආයතන:** තාවකාලික ද්‍රවශීලතා ආතතියක පසුවන, එමෙන්ම පවත්නා සියලුම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමේ විකල්ප භාවිත කර ඇති, සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින්මතු "බලපත්‍රලාභී බැංකු" ලෙස හැඳින්වෙනු ලැබේ).

ආ) **හදිසි ණය සහ අත්තිකාරම් සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි සිදු කෙරේ,** එබැවින්, එය බලපත්‍රලාභී බැංකුවල අයිතියක් ලෙස නොසැලකෙනු ඇත.

ඇ) **ව්‍යවහාර මුදල්:** හදිසි ණය සහ අත්තිකාරම් සෑම විටදී ම ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් සපයනු ලැබේ. විනිමය අනුපාතිකය සම්බන්ධයෙන් හට ගත හැකි අවදානම් මෙන්ම ව්‍යවහාර මුදල් නොගැළපීම් සහ ණය ආපසු අය කර ගැනීමේ අවදානම් අවම කර ගැනීම සඳහා මෙම ණය පහසුකම් විදේශ ව්‍යවහාර මුදලින් සපයන්නේ නැත.

ඈ) **පොලී අනුපාතිකය:** පවත්නා වෙළඳපොළ පොලී අනුපාතික සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සලකා බැලීමෙන් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් පොලී අනුපාතිකය තීරණය කරනු ඇත.

ඉ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම සැපයීම සඳහා පිළිගත හැකි ඇප සුරැකුම්:** ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ඉඩම් හා ගොඩනැඟිලි සහ ඇපකර සහිත ලැබිය යුතු ණයවලින් සමන්විත පිළිගත හැකි ඇප සුරැකුම් ගණනාවක් මේ සඳහා සලකා බලනු ලැබේ.

ඊ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබා දීම පිළිබඳ තක්සේරු කිරීම:** ශ්‍රී ලංකා මහ බැංකු ශේෂ පත්‍රය මත හට ගත හැකි ඕනෑම අහිතකර බලපෑමක් වැළැක්වීමේ අරමුණින්, නුබුන්වත් යැයි සැලකෙන බලපත්‍රලාභී බැංකුවලට පමණක් මෙම ණය පහසුකම සැපයෙනු ඇත. කෙසේ වෙතත්, හදිසි ණය සහ අත්තිකාරම් ඉල්ලනු ලැබූ බැංකුවට ප්‍රමාණවත් ඇපකර නැති අවස්ථාවකදී, ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා මහා බැංකුවට දෙනු ලැබූ පැහැදිලි ඇපකරයක් මත, පද්ධතිමය අවදානමක් අවම කිරීම අවශ්‍ය වන්නා වූ සුවිශේෂී තත්ත්වයන් යටතේ, එක් එක් සිදුවීම මත පදනම්ව, මෙම හදිසි ණය පහසුකම බුන්වත් හෝ අනාගතයේ දී බුන්වත්බවට පත් වීමට ඉඩ ඇතැයි තක්සේරු කළ බැංකුවක් වෙත ද පිරිනැමීමේ හැකියාව ඇත.

උ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබාගන්නා බැංකු සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුගමනය කරන්නා වූ අධීක්ෂණ ක්‍රියාමාර්ග:** හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබන බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි අධීක්ෂණයට යටත් වනු ඇති අතර එම බැංකුවල ණය කළඹ ප්‍රසාරණය කිරීම සහ අභිමතානුසාරී ගෙවීම් සිදු කිරීමට අදාළව සීමාවන් පනවනු ලැබේ.

**3.2.3. බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු අංශයෙහි අභියෝගාත්මක ඉදිරි දැක්ම සහ මූල්‍ය අංශයෙහි ආරක්ෂණ ජාල සම්බන්ධයෙන් පවතින ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව සලකා බලමින්, අර්බුද කළමනාකරණ රාමුව යටතේ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රමුඛ අංශයක් ලෙස බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම හඳුනා ගන්නා ලදී. ඒ අනුව, නිරාකරණය, තැන්පතු රක්ෂණය සහ බලපත්‍රලාභී බැංකු වසා දැමීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් 1988 අංක 30 දරන බැංකු පනතට පරිපූරකයක් ලෙස බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමේ දී මූල්‍ය ස්ථාවරත්ව මණ්ඩලය (Financial Stability Board) විසින් මූල්‍ය ආයතන සඳහා නිකුත් කරන ලද සඵලදායී නිරාකරණ තන්ත්‍රයන්හී ප්‍රධාන ලක්ෂණ සහ තැන්පතු රක්ෂණ කරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (International Association of Deposit Insurers) විසින් නිකුත් කරන ලද සඵලදායී තැන්පතු රක්ෂණ ක්‍රම සඳහා වන ප්‍රධාන මූලධර්ම සලකා බලන ලදී. මෙම යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත 2023 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

**3.2.4. අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින මූල්‍ය සහ ආර්ථික තත්වයන් වල පෙර නොවූ විරූ මට්ටමේ පීඩාවන්, මූල්‍ය අංශයේ පාලන අධිකාරීන් අතර අර්බුද කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවක් පැන නැගීමට හේතු සාධක විය. ශ්‍රී ලංකාව තුළ මෙතෙක් අර්බුද කළමනාකරණය සඳහා ආයතනික රාමුවක් නොමැති වීම, අර්බුද සඳහා සූදානම් වීම සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණ බිඳ වැටීමේ

8

අවදානම අඩු කිරීම, සහ මූල්‍ය අර්බුදයේ බලපෑම අවම කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර "මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුවක්" (FCMC) පිහිටුවීම සඳහා හේතු වී ඇත. මූල්‍ය අංශයෙහි අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව (TCMC) විසින් යෝජිත මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුව (FCMC) වෙත සහාය ලබා දෙනු ඇති අතර, මෙම යෝජිත කමිටු අර්බුද පවතින මෙන්ම අර්බුද නොපවතින කාලයන්හි දී ද ක්‍රියාත්මක වනු ඇත. මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුවෙහි (FCMC) මුලසුන මහ බැංකු අධිපතිතුමන් විසින් දරනු ඇති අතර මුදල් මණ්ඩලයෙහි සාමාජිකයෙකු, භාණ්ඩාගාර ලේකම් තුමා, මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් තුමා සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකත්වය දරනු ඇත.

**3.2.5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන වැඩි දියුණු කළ අධීක්ෂණ ප්‍රවේශ**

මෑත කාලීනව බැංකු අංශයට අදාළව සිදු වූ සාර්ව ආර්ථික තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ ක්‍රියාමාර්ග තීව්‍ර කරන ලද අතර ඒ යටතට බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය නිර්ණායකයන් සමීපව සුපරීක්ෂණය කිරීම, තෝරාගත් බැංකු කාර්යයන් විස්තරාත්මකව සමාලෝචනය කිරීම සහ ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන්හී නිරත වන නිලධාරීන් සමඟ එම බැංකුවල ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන තත්වයන් පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වීම අන්තර්ගත වේ. තවද, බැංකු වල තත්වයන් සහ අර්බුද සඳහා ඇති පෙර සූදානම හොඳින් අවබෝධ කරගැනීම පිණිස මුදල් මණ්ඩලය විසින් අඛණ්ඩව බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂක මණ්ඩල, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන්හී නිරත වන නිලධාරීන් සමඟ නිරන්තර සාකච්ඡා පවත්වන ලදී.

**3.2.6 සන්නිවේදන උපායමාර්ග:**

බැංකු අංශයෙහි ස්ථාවරත්වය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීම පිණිස, අර්බුද සඳහා පෙර සූදනමෙහි ඇති පුළුල් පැතිකඩයන් ආවරණය කරමින් වර්තමානයේ පවත්නා සන්නිවේදන උපායමාර්ග තවදුරටත් පුළුල් කර ඇත.

**ඉදිරි ගමන්මග:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුද සඳහා වූ පෙර සූදානම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින් යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍රලාභී බැංකු වෙත හදිසි ණය සහ අත්තිකාරම් සැපයීමේ සූදානම සහතික කිරීම ද ඉදිරියේදී අපේක්ෂා කෙරේ.

මූලාශ්‍රය

1. International Monetary Fund. (2020). Managing Systemic Banking Crises - New Lessons and Lessons Relearned. Departmental Paper No. 2020/003. International Monetary Fund, Washington D.C.